රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

சுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை.

Independence Square, Colombo 07, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/SLAS/Policy Decisions | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.09.21 |

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

කොමිෂන් සභා ලේකම්වරුන්

දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීම</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති අංක 107 අනුව දීප ව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු බැවින් මින් ඉදිරියට එම තනතුරුවලට පත් කිරීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් පූර්ව අනුමැතිය ලබා ගන්නා ලෙස දන්වා ඇත.

02. එලෙස ඉහත සඳහන් පරිදි කටයුතු නොකරන අවස්ථාවලදී එම තනතුරට පත් කිරීම ශුන්‍ය හා බල රහිත ලෙස සලකන බවට සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දන්වන ලෙසට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මා වෙත දන්වා ඇත.

03. ඒ අනුව මින් ඉදිරියට ඉහත නියෝගය පරිදි, දීප ව්‍යාප්ත සේවාවන්හි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු විශේෂ ශ්‍රේණියේ කිසිදු තනතුරක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව පත් කිරීම් සිදු නොකරනු ලබන බව මෙයින් කාරුණිකව දන්වමි.

කේ.ඩී.එන්. රංජිත් අශෝක

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112 – 698605 ෆැක්ස් : 0112 - 683651

විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com

පිටපත :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු. දැ.ගැ.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය - කරු. දැ.ගැ.ස.